# ගොවි සංවිධාන කාර්යභාරය සහ සවිබල ගැන්වීම

සංවිධානයක් යනු පොදු අරමුණක් හෝ අරමුණු කිහිපයක් ඉෂ්ඨ කරගැනීම සඳහා ඒකරාශි වූ ජන කණ්ඩායමකි. තනි තනිව ක්‍රියාත්මක වීමට වඩා සාමූහිකව කටයුතු කිරීම තුළින් ප්‍රතිලාභ වැඩිපුර ලබා ගැනීමට හැකි වී තිබීම සංවිධාන බිහිවීමට මූලික හේතුව වී ඇත. තනි පුද්ගලයෙකුට යමක් ලබා ගැනීමට කළ හැකි බලපෑමට වඩා වැඩි බලපෑමක් සාමූහිකව කණ්ඩායමක් වශයෙන් ඉදිරිපත් වීමෙන් කළ හැකි බවට උදාහරණ රාශියක් පෙන්වාදිය හැකි ය. වෛද්‍යවරු, පෞද්ගලික බස් හිමියන්, විදුලිබල, වරාය සේවකයන් ඉල්ලීම් දිනා ගැනීම පෙන්වා දිය හැකි ය. මේ අය තනි තනිව ක්‍රියාත්මක වුවා නම් මෙම ඉල්ලීම් නො ලැබෙනු ඇත. සංවිධානවල ස්වරූපය මත විධිමත් හා අවිධිමත් සංවිධාන ලෙස වර්ග කෙරේ. විධිමත් සංවිධාන යනු නීත්‍යානුකූලව ලියා පදිංචි වූ සංවිධානයි. උදාහරණයක් ලෙස වෘත්තිය සමිති දැක්විය හැකි ය. අවිධිමත් සංවිධානය යනු නීතිමය වශයෙන් ලියාපදිංචි නොවූ සංවිධාන යි. සීට්ටු සංවිධාන උදාහරණයකි. කුඩා කණ්ඩායම් බොහොමයක් අයත් වන්නේ අවිධිමත් සංවිධාන ගණයට ය. මෙම සංවිධානවල අරමුණු හා ක්‍රියාකාරකම් විධිමත් සංවිධානයට සමාන ය. එසේ වුව ද නිලධාරී මණ්ඩලයක් අනිවාර්ය නොවේ.

ශ්‍රී ලංකාවේ ගොවි සංවිධාන ඉතිහාසය රජ දවස දක්වා දිවයයි. වාරි ජලය කළමනාකරණය සහ වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වාරි සභා පැරණි රජ කාලයේ පිහිටුවා ඇති බව කොණ්ඩවටුවාන සෙල්ලිපියෙ හි සඳහන් වේ. එහි සඳහන් පරිදි වගා කාලසටහන් සකස් කර ගත්තේ ගම්මුන්ගේ සම්මුති තුළිනි. වගා රීති කඩ කිරීමට දඩුවම් නියම කර ගත්තේ ගොවීන් ම ය. බටහිර ජාතීන්ගේ ආගමනයත් සමග සාමූහිකත්වය පදනම් කරගත් ගොවි ශිෂ්ටාචාරය දෙදරා ගිය අතර සමාජය තුළට ආත්මලාභය මුල්කරගත් වාණිජ හැඟීම් ප්‍රවේශ වීමක් සිදු විය. එහි ප්‍රතිඵලයක් ලෙස පොදු කටයුතු ඉටුකිරීම සඳහා අණ පනත් ගෙන ඒමට යටත් විජිත පාලකයන්ට සිදුවිය. එහි පළමු අවස්ථාව ලෙස 1856 අංක 9 දරන වාරිමාර්ග ආඥා පනත ඇති කරන ලදී, මේ මඟින් ගම් සභාව නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමටත්, වාරිමාර්ග කළමනාකරණ නීතී රීතී සකස් කිරීමටත් අවස්ථාව සලසා දෙනු ලැබිණි. මෙම පනත යටතේ නීතිරීති සකස් කිරීම දිසාපතිවරයාගේ සහභාගිත්වයෙන් වූ ගම් සභාව මඟින් සිදු කළ අතර වෙල්විදානේ එම නීති ක්‍රියාත්මක කරන ලදී.

1958 අංක 01 දරන කුඹුරු පනත සම්මත වීමත් සමග වාරි මාර්ග නීති රීති සකස් කිරීම සඳහා ගොවි කාරක සභා පිහිටුවන ලදී, වෙල්විදානේ තනතුර අහෝසි කර ඔහු විසින් ඉටු කරනු ලැබූ රාජකාරී කටයුතු ගොවි කාරක සභාව මඟින් ඉටුකරන ලදී, 1968 සංශෝධනයක් මඟින් වාරිමාර්ග කළමනාකරණය සඳහා දිසාපතිවරයාට ඇති බලතලවලට අමතරව ගොවි කාරක සභා සඳහා ද අවශ්‍ය බලතල පවරා දෙනු ලැබී ය. 1980 දශකයේ විවිධ ව්‍යාපෘති යටතේ ගොවි සංවිධාන පිහිටුවීම ආරම්භ කරන ලදී, එම සංවිධානවල මූලික පරමාර්ථය වූයේ කාර්යක්ෂම වාරිමාර්ග කළමනාකරණයක් පවත්වාගෙන යාම යි. මෙහි සාර්ථකත්වය මත 1990 අංක 09 දරන ගොවිජන සේවා සංශෝධන පනත මඟින් ගොවි සංවිධාන නීතිමය වශයෙන් පිළිගත් ආයතන බවට පත්කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන යොදවනු ලැබී ය. එමඟින් ගොවි සංවිධාන ගොවිජන සේවා කොමසාරිස්වරයා යටතේ ලියාපදිංචි කිරීමට අවශ්‍ය විධිවිධාන යොදන ලදී, ඒ අනුව මේ වන විට ගොවි සංවිධාන 14,000 ක් පමණ ලියාපදිංචි කොට ඇත. ගොවි සංවිධාන ඉතිහාසය දෙස විමසා බැලීමේ දී පෙනී යන ප්‍රධාන ලක්ෂණය නම් ගොවි සංවිධාන පිහිටුවා ඇත්තේ ගොවීන්ගේ උවමනාවට නොව පාලකයින්ගේ උවමනාවන් සපුරා ගැනීම සඳහා ය.

**ගොවි සංවිධානවල කාර්යභාරය.**

ගොවි සංවිධානවල කාර්යභාරයන් විවිධ අණ පණත් මඟින් සහතික කර ඇත. ඒ අනුව 1994 අංක 13 දරන වාරිමාර්ග (සංශෝධන) පනත යටතේ 23.1 වගන්තිය අනුව ගොවි සංවිධානයට ස්වකීය බල ප්‍රදේශය තුළ ජල සම්පාදනය සහ ඉඩම් වගා කිරීමට අදාළ සියලු කටයුතු හා ඒවාට සම්බන්ධ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා වාරිමාර්ග නඩත්තු කටයුතු අදාළ වේ. මේ යටතේ ජලය නිකුත් කරන දින නියම කිරීම, ජල කාල සටහන් සැකසීම, ජලය ලබා දෙන ප්‍රමාණය තීරණය කිරීම, කන්න රැස්වීම්වල එකඟ වූ ආකාරයට ජලය බෙදීම සහ වගා කළ යුතු බෝග තීරණය කිරීමේ

කාර්යයන් ගොවි සංවිධානයට පැවරේ. ජල සම්පාදනය සහ ඉඩම් වගා කිරීම සම්බන්ධ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම යනුවෙන් අදහස් වන්නේ වාරිමාර්ග ව්‍යාපාරයක් යටතේ නීත්‍යානුකූලව වගා කටයුතු කරන ගොවීන් සඳහා එමගින් ලැබෙන ජලය ඇතුළු අනෙකුත් ප්‍රතිලාභ ලබා ගැනීමට ඇති අයිතිය ආරක්ෂා කිරීම යි. මේ අනුව, කිසියම් නීතියක් හෝ චාරිත්‍රයක් නො පිළිපැදීම හෝ ඒවාට පටහැනිව ක්‍රියා කිරීම නිසා වගාකරුවන්ට විය හැකි හානිවලින් ආරක්ෂා කිරීම සඳහා පනත යටතේ අවශ්‍ය පියවර ගැනීමේ හැකියාව ගොවි සංවිධානය සතුව ඇත. වාරිමාර්ග නඩත්තු කටයුතු යටතේ ගොවි සංවිධාන බල ප්‍රදේශය තුළ පිහිටි වැව් අමුණු, ඇළවේළි සොරොව් ආදී වාරිමාර්ග ව්‍යාපාරයට අයත් සියළු ම ඉදිකිරීම්වල නඩත්තුව ගොවි සංවිධානවලට පැවරී ඇත. මේ සඳහා වාරිමාර්ග ගාස්තු අය කිරීමට ගොවි සංවිධාන වෙත බලය පවරා ඇත. වාරිමාර්ග ආඥා පනත යටතේ පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී ගොවි සංවිධානයට හෝ ගොවි සංවිධාන නියෝජිතයෙකුට එය ඉටුකිරීමට ඉඩ නො දීමක්, හිංසා කිරීමක්, හෝ අවහිර කිරීමක් සිදුකළ ඕනෑ ම පුද්ගලයෙකු එම වරද සිදුකළ ස්ථානය අයත් බල ප්‍රදේශයේ අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණයේ දී නඩු පැවරිය හැකි බව වාරිමාර්ග ආඥා පනතේ 95 වගන්තියේ සඳහන් වේ.

ගොවි සංවිධානවල කාර්යභාරයන් පිළිබඳ විමසා බැලීමේ දී ඊළඟට වැදගත් වන්නේ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත යි. එම පනතේ 45 දරන වගන්තිය යටතේ ගොවි සංවිධානවලට තම සාමාජිකයන් සඳහා ණය සැපයීමට බලය පවරා ඇත. මේ සඳහා බැංකු වලින් ණය පහසුකම් ලබා ගැනීම, බදු දීම, විකිණීම, සාමාජිකයන්ගෙන් තැන්පතු ලබා ගැනීමට බලය පවරා ඇත.

මෙම පනතේ 48 වන වගන්තිය යටතේ ගොවිජන සංවර්ධන සභාවට ගොවි සංවිධාන විසින් පහත සඳහන් ආකාරයට සහාය දැක්විය යුතු ය.

(අ) ස්වකීය බල ප්‍රදේශය තුළ කුඹුරු සහ ගොඩ ඉඩම් වගා කිරීම සඳහා සැලසුම් සකස් කිරීම.

(ආ) හරියාකාරව වගා කරනු නො ලබන කෘෂිකාර්මික ඉඩම් පිළිබඳ තොරතුරු එක් රැස් කර සැපයීම.

(ඇ) කෘෂිකාර්මික ඉඩම්, කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ සහ කෘෂිකාර්මික සතුන් පිළිබඳ තොරතුරු එක්රැස් කර සැපයීම.

(ඉ) එම බෝග හා සතුන් රෝගවලින් හා වසංගත වලින් ආරක්ෂා කර ගැනීමට වග බලාගැනීම.

(ඊ) බල ප්‍රදේශ තුළ ඉඩම් හිමි ගොවීන් භුක්තිකරුවන් හා කෘෂිකාර්මිකයින් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පාරිසරික හිතකර ක්‍රම යොදා ගැනීම සඳහා ඔවුන් ධෛර්යමත් කිරීම.

මෙම පනත මගින් සාමාජිකත්ව ණය සැපයීම, තොරතුරු රැස්කිරීම සහ පුහුණු වැඩසටහන් සැපයීම යන කාර්යයන් ගොවි සංවිධානවලට පවරා ඇත. ගොවි සංවිධාන සඳහා නීතියෙන් පැවරී ඇති කාර්යභාරය විග්‍රහ කිරීමේ දී පශ්චාත් නිෂ්පාදන කටයුතු එනම්, නිෂ්පාදන ගබඩා කිරීම, සැකසීම සහ අලෙවිය කෙරෙහි අවධානය යොමු කර නැති බව පෙනේ.

**ගොවි සංවිධානවල සාර්ථකභාවය.**

ශ්‍රී ලංකාවේ ගොවි සංවිධාන 14,000ක් පමණ පිහිටුවා ඇතත් ක්‍රියාත්මක මට්ටමේ පවතින්නේ ගොවි සංවිධාන 6000ක් පමණ බව හෙළි වී ඇත. දැනට කරන ලද අධ්‍යයනයන්ට අනුව ප්‍රධාන වාරිමාර්ග යටතේ පිහිටුවා ඇති ගොවි සංවිධාන මගින් ජලය බෙදාහැරීම, කෘෂිකාර්මික සැලසුම් සකස් කිරීම, ආයතන අතර සම්බන්ධතා ගොඩ නැගීම සහ වාරිමාර්ග නඩත්තු කටයුතු යම් දුරකට ක්‍රියාත්මක වන බව හෙළි වී ඇත. ව්‍යාපාර කළමනාකරණ කමිටුවේ ගොවි නියෝජිතයින් බහුතරයක් සිටීම මීට හේතුව ලෙස සොයා ගෙන තිබේ. එසේ වුව ද, මෙම කමිටුවට ප්‍රමාණවත් තරම් බලයක් හා අධිකාරියක් නොමැති නිසා එහි කටයුතු නිසියාකාරව සිදු නො වන බව ද හෙළිදරව් වී ඇත. මෙම කමිටුවට සහභාගිවන නිලධාරීන්ට තීරණ ගැනීමේ හෝ ක්‍රියාත්මක කිරීමේ බලයක් නොමැතිකම මීට හේතු යි.

ඇතැම් ගොවි සංවිධාන සාමාජිකයින්ට ණය ලබාදීම, සහනාධාර පොහොර බෙදා දීම වැනි කටයුතු සාර්ථකව සිදු කරන බව වාර්තා වී තිබේ. එම ගොවි සංවිධාන වල නායකත්ව දක්ෂතාව, නිලධාරීන්ගේ කැපවීම සහ සාමාජිකයින්ගේ උනන්දුව මේ සඳහා හේතු ලෙස සඳහන් කළ හැකි ය.

ඕනෑම ගොවි සංවිධානයක සාර්ථකත්වය රඳා පවතින්නේ තම සාමාජිකයන්ට සිදුවන සේවාවන් හි ප්‍රමාණය මත යි. ගොවි සංවිධානයක් තුළින් පහත සඳහන් සේවාවන් ඉටු විය යුතු ය.

1. අලෙවි සේවාවන් (බීජ, පොහොර, කෘමි නාශක සැපයීම, නිෂ්පාදන අලෙවි කිරීම)

2. මූල්‍ය සේවාවන් (ඉතිරි කිරීම සහ ණය)

3. තාක්ෂණික සේවාවන් (ව්‍යාප්ති, පර්යේෂණ)

4. අධ්‍යාපන සේවාවන් (ව්‍යාපාර කුසලතා, සෞඛ්‍ය)

5. සුබසාධන සේවාවන් (සෞඛ්‍ය, සමාජ ආරක්ෂණ)

6. ප්‍රතිපත්ති සඳහා උපදේශන සේවා (රාජ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීමට උපදෙස්)

7. පොදු සම්පත් කළමනාකරණ සේවා (ජලය, වන)

ඉහත සඳහන් සේවාවන් සැපයීම සලකා බලන විට ශ්‍රී ලංකාවේ ගොවි සංවිධාන සාර්ථක යැයි පැවසීමට නො හැක. මේ නිසා, ගොවි ගැටලු දිනෙන් දින උග්‍ර වී ඇත. සාමූහිකව ක්‍රියා නො කිරීම නිසා ගොවි හඬ ඉස්මතු වන්නේ නැත. එබැවින්, ගොවීන්ගේ ප්‍රශ්න විසඳීමේ දී, ගොවි සැලසුම් සකස් කිරීමේ දී සහ ක්‍රියාත්ම කිරීමේ දී මෙන් ම අධීක්ෂණය කිරීමේ දී ගොවීන්ගේ සහභාගිත්වයක් නැත. එකී කාර්යයන්ට බොහෝ විට සම්බන්ධ වන්නේ රාජ්‍ය නිලධාරීන්, රාජ්‍ය නො වන සංවිධාන සහ ආධාර සපයන රටවල නියෝජිතයින් ය. මේ නිසා බොහෝ වැඩසටහන් වලින් අපේක්ෂිත අරමුණු කරා ළඟා වීමට නො හැකි වී තිබේ. ගොයම් කැපෙන අවස්ථාවේ දී වී මිල පහළ බසින විට ඇතමෙක් රජය වී මිල දී ගන්නේ නැති බවට රජයට චෝදනා කරති. තවත් සමහරෙක් වී මෝල් හිමියන් මිල තීරණය කරන බවට චෝදනා එල්ල කරති. එමෙන් ම, ගොවීන් ප්‍රමිතියට වී අලෙවි නො කරන බවට තවත් සමහරු චෝදනා කරති. තව ද, කල් වේලා ඇතිව සැලසුම් ඉදිරිපත් නො කළ බවට නිලධාරීන්ට චෝදනා එල්ල කරති. එසේ වුව ද ගොවීන්ගේ හඬ බලවත් නැත. ඊට හේතුව, ගොවි සංවිධානවල ඇති දුර්වලතාවය යි. ඉන්දියාව වැනි රටවල ගොවි නිෂ්පාදන මිල කඩා වැටෙන විට රජය සෘජුව සම්බන්ධ වී එහි දී ලාභ-පාඩු ගැන කල්පනා නො කර එම නිෂ්පාදන මිල දී ගනු ලබයි. ඒ සඳහා රජය සෑම වසරක ම අය වැයෙන් මුදල් වෙන් කරයි. අපේ රටේ ගොවි සංවිධාන ගොවි ප්‍රශ්න විසඳීම වෙනුවට රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට සහාය වීමක් දක්නට ලැබේ.

**ගොවි සංවිධාන සවිබල ගැන්වීම.**

විවෘත ආර්ථික ක්‍රමය ක්‍රියාත්මක කිරීමත් සමග රජය විසින් කරන ලද කාර්යයන් පෞද්ගලික අංශයට පවරන ලදී. වියදම් අධික වීමත් ලාභ අඩුවීමත් හේතුවෙන් පෞද්ගලික අංශයේ සහභාගිත්වය අඩු වී ඇත. මේ තත්ත්වය තුළ ගොවි සංවිධාන ශක්තිමත් නො කර කෘෂිකාර්මික සංවර්ධනයක් ළඟා කර ගත නො හැකි බව තහවුරු වී ඇත. ගොවි හඬ ශක්තිමත් කිරීමට නම් ගොවි සංවිධාන ශක්තිමත් විය යුතු ය. සාමූහිකව කටයුතු කිරීම තුළින් ගොවි හඬ නියෝජනය කළ හැකි ය. ගොවි සංවිධාන ශක්තිමත් කිරීමේ දී, සංවිධාන නිපුණතා, කළමනාකරණ නිපුණතා හා ව්‍යාපාර නිපුණතා යන තෙවැදෑරුම් නිපුණතාවලින් පෝෂණය කළ යුතු ය. සංවිධාන නිපුණතා වර්ධනය තුළින් නිවැරදි නායකත්වයක් ගොඩනැඟීම සහ නිලධාරී- සාමාජික සබඳතා වර්ධනය තහවුරු වේ. කළමනාකරණ නිපුණතා තුළින් නිවැරදි තීරණ ගැනීම, සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණ හැකියාවන් දියුණු වේ. ව්‍යාපාර නිපුණතා තුළින් වෙළඳපොළ සඳහා භාණ්ඩ නිෂ්පාදනය කෙරේ. එමගින් සංවිධානයේ අරමුදල් තර වේ. මේ අනුව තෙ වැදෑරුම් කුසලතා සංවර්ධනය තුළින් තිරසාර ගොවි සංවිධාන ස්ථාපනය වනු නො අනුමාන ය. තිරසාර ගොවි සංවිධාන තුළින් පහත සඳහන් ප්‍රතිලාභ අත්පත් කරගත හැකි ය.

01. නිෂ්පාදන වියදම් අඩු කරගැනීම.

බීජ, පොහොර, කෘමිනාශක වැනි යෙදවුම්, තොග මිල ගණන් වලට මිල දී ගැනීමට ගොවි සංවිධාන වලට හැකි ය.

එමෙන් ම, අඩු මිලට ප්‍රවාහනය කිරීමට ද හැකියාව ලැබේ.

02. ලාභ වැඩි කරගැනීම.

සංවිධාන මගින් ගොවි නිෂ්පාදන අලෙවි කිරීමේ දී තොග වෙළෙඳුන්ට/අපනයනකරුවන්ට/සුපිරි වෙළෙඳසල්වලට සෘජුවම අලෙවි කිරීමය. තුළින් වැඩි මිලක් ලබා ගත හැකි ය.

03. රාජ්‍ය ප්‍රතිපත්ති සහ සංවර්ධන වැඩසටහන් සඳහා බලපෑම් කිරීමට හැකිවීම.

ශක්තිමත් සංවිධාන තුළින් ගොවි හඬ ප්‍රබල කළ හැකි ය. එමගින් රාජ්‍ය ප්‍රතිපත්ති හා සංවර්ධන වැඩසටහන් සකස් කරන විට, ක්‍රියාත්මක කරන විට, අධීක්ෂණය කරන විට ගොවීන්ගේ අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් උදා වේ.

04. සම්පත් සහ යටිතල පහසුකම් කළමනාකරණය කිරීමේ හැකියාව වර්ධනය වීම.

මනා කළමනාකරණයක් නොමැතිකම කෘෂිකාර්මික සංවර්ධනයේ දී ප්‍රධාන ගැටලුවක් වී තිබේ. සම්පත්

සීමිත ය. එබැවින් ඒවා මනාව කළමනාකරණය කළ යුතු ය. උදා: ජලය පෙන්වා දිය හැකි ය. කණ්ඩායමක් ලෙස සාමුහිකව කටයුතු කිරීම තුළින් ජලය අපතේ යාම අඩු කළ හැකි ය.

විවෘත ආර්ථික ක්‍රමය ක්‍රියාත්මක වන මෙම අවධියේ කෘෂිකර්මය, කෘෂි ව්‍යාපාර බවට පරිවර්තනය විය යුතු ය. ඒ සඳහා ශක්තිමත් ආයතන ව්‍යුහයක් ගොවිපොළ මට්ටමේ ස්ථාපිත වීම අත්‍යාවශ්‍ය ය. විවෘත ආර්ථික ක්‍රමයේ ප්‍රතිලාභ ගොවීන්ට ලබා ගැනීමට නො හැකි වී ඇත්තේ ශක්තිමත් ආයතන ව්‍යුහයක් නොමැති වීමෙනි. සමෘද්ධිමත් ගොවි ජනතාවක් බිහි කිරීම සඳහා ගොවීන් සංවිධානය වී ගොවි හඬ ජාතික මට්ටමට ගෙන යා යුතු ය.

එල්.පී. රූපසේන
*නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ)*
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.

## කෘෂි සන්නිවේදන මාධ්‍ය වැඩමුළුව

කෘෂිකර්මාන්තය මුල්කරගත් ග්‍රාමීය අංශය දියුණු කිරීම සඳහා කෘෂිකාර්මික සන්නිවේදනය ඉවහල් කරගැනීමේ අරමුණින් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ ප්‍රවෘත්ති හා ප්‍රකාශන ඒකකය මඟින් පසුගිය ජුනි 15-17 දක්වා නුවරඑළියේ දී "කෘෂිකාර්මික සන්නිවේදනයේ දී මාධ්‍යවේදීන්ගේ කාර්යභාරය - ආකල්පමය වෙනසකට ප්‍රවේශයක්" යනුවෙන් තෙදින මාධ්‍ය වැඩමුළුවක් පවත්වන ලද අතර මෙරට ප්‍රධාන පෙළේ විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආයතනවල කෘෂි පුවත් වාර්තාකරණයෙ හි නිරත මාධ්‍යවේදීන් දහසය දෙනෙක් ඒ සඳහා සහභාගි වූහ.

**සම්පත් දායකයින් හා ඉදිරිපත් කළ ක්ෂේත්‍ර**

මෙම වැඩමුළුව සඳහා උපදේශකත්වය මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර, මහාචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස විසින් සිදුකෙරුණු අතර හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ නීතිඥ ලලිත් කාන්ත ජයසේකර,නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ)ආචාර්ය එල්.පී රූපසේන, ආචාර්ය එස්.එම් සේනානායක, ජේ.කේ.එම්.ඩී.චන්ද්‍රසිරි, මධ්‍යම පළාත් කෘෂිකර්ම අමාත්‍ය නිමල් පියතිස්ස, මධ්‍යම පළාත් සභා මන්ත්‍රිනි විමාලි කරුණාරත්න, පරිසරවේදී තිලක් කන්දේගම, නීතිඥ ප්‍රසන්න සංජීව ගොන්සේකා, නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් ඊ.පී.ඩී.පී කුමාරසිංහ,එයිට්කන් ස්පෙන්ස් ආයතනයේ සංචාරක හෝටල් කළමනාකරු අමල් නානායක්කාර යන මහත්ම මහත්මීන් විසින් සම්පත් දායකත්වය සපයන ලදී. එහි දී කෘෂි සන්නිවේදනය හා ජාතික සංවර්ධනය, කෘෂි සන්නිවේදනය ආශ්‍රිත ව මුද්‍රිත මාධ්‍ය හා මාධ්‍යකරුවාගේ වගකීම, මධ්‍යම පළාතේ දේශීය කෘෂිකර්ම වැඩපිළිවෙළ,, නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ කෘෂි සන්නිවේදන ක්‍රියාකාරකම්,සොබාදහම් ගොවිතැන,කෘෂි අලෙවිකරණ තොරතුරු ක්‍රමවේදය,ජනමාධ්‍ය නීතිය,යුද්ධයෙන් පසු ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය(කෘෂිකර්මාන්තය ආශ්‍රිත)ගැමි කාන්තා සම්මේලනය හා සමාජ සජීවීකරණය, එළවළු නිෂ්පාදනය හා අලෙවිය,ප්ලාස්ටික් ඇසුරුම් ව්‍යාපෘතිය, හෙ.ගො.ප.පු. ආයතනයේ ගොවිකටයුතු පුහුණු කිරීම් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය(කෘෂිකර්මාන්තය ආශ්‍රිත)ගැමි කාන්තා සම්මේලනය හා සමාජ සජීවීකරණය, එළවළු නිෂ්පාදනය හා අලෙවිය,ප්ලාස්ටික් ඇසුරුම් ව්‍යාපෘතිය, හෙ.ගො.ප.පු. ආයතනයේ ගොවිකටයුතු පුහුණු කිරීම් යන විෂය ක්ෂේත්‍රයන් පිළිබඳ ව සාකච්ඡාවට බඳුන් විය.

**වැඩසටහන තුළ ඉදිරිපත් වූ යෝජනා**

-හෙ.ගො.ප.පු ආයතනය හා කැලණිය විශ්ව විද්‍යාලය ඒකාබද්ධ හයමාසික කෘෂි සන්නිවේදන ඩිප්ලෝමා පාඨමාලාවක් ඇරඹීම

-හෙ.ගො.ප.පු ආයතනයේ පර්යේෂණ ප්‍රජාව ක්ෂේත්‍ර චාරිකා සඳහා සහභාගි වීමේ දී ඔවුන් හා එක්වීමට මාධ්‍යවේදීන්ට ද ආරාධනා කිරීම

-හෙ.ගො.ප.පු ආයතනය තොරතුරු කේන්ද්‍රයක් ලෙස මාසයකට හෝ මාස තුනකට වතාවක් හෝ ජනමාධ්‍යවේදීන් රැස් කොට තොරතුරු බෙදා දී සංවාදයක් ජනිත කිරීම

-කෘෂි ප්‍රවෘත්තිවලට ප්‍රමුඛතාවය ලබා දීමේ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම

-සෑම මාධ්‍ය ආයතනයක ම කෘෂි ඒකකයක් පිහිටුවීම

-පරිසරවේදී තිලක් කන්දේගම මහතාගේ දේශනයන් විවිධ පළාත්වල පැවැත්වීමේ දී ඒ පිළිබඳ අදාළ ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ට ද දන්වා සිටීම.

වත්සලා ගමගේ
ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරී